# ළමා පරිසරවේදියා තේරීමේ තරඟය

## දෙමාපියන් සහ ගුරුවරුන් සඳහා මාර්ගෝපදේශ

### ළමා පරිසරවේදියෙකු නිර්මාණය කළ යුත්තේ ඇයි ?

වේගයෙන් වානිජකරණය වන වර්තමාන ලෝකයේ බොහෝ දෙමාපියන් බෙහෙවින් කාර්යබහුලය. තවද විභාග ඉලක්ක කරගත් අධ්‍යාපන ක්‍රමය හේතු කොටගෙන පාසල් දිවිය ඇරඹුමත් සමග පෞද්ගලික පන්ති සඳහා නැඹුරුවීමේ ප්‍රවණතාව වැඩි වී ඇත. ඉහත හේතුන් මූලික කොටගෙන දරුවන් එළිමහන් ක්‍රියාකාරකම්වල යෙදීම හා ස්වාභාවික පරිසරය හා ගැටීම කාලයත් සමග අඩුවෙමින් පවතින බව පෙනේ. එමෙන්ම, රූපවාහිනිය, පරිගණක, ජංගම දුරකථන ආදී තාක්ෂණික මෙවලම්වලට ඇබ්බැහිවීම දරුවන්ට ඇති කෙටි විවේක කාලයද ආක්‍රමණය කර ඇත. මෙවැනි තත්වයක් තුළ ගුරවරුන් සහ දෙමාපියන් විසින් ආයතනික ලාංඡන, සංඥා, මල්, පැළෑටි, පත්‍ර වර්ග, ඓතිහාසික ස්ථාන ආදිය පිළිබඳව පෙලපොත්, පින්තූර භාවිතයෙන් ඉගැන්වීමට උත්සහ කලද සමහරක් දරුවන් අවම වශයෙන් තම ගෙවත්තේ හෝ පාසල් බිමේ හමුවන ඖෂධ පැළෑටි, කුඩා සතුන් කිහිපයක් හෝ ප්‍රායෝගිකව හදුනාගැනීමට අපොහොසත් බව පෙනී යයි. එබැවින්, රටේ මතු පරපුර, දේශීයත්වය අගය කරමින් ස්වාභාවික පරිසරයට ආදරය සහ ගෞරවය දක්වන වගකිවයුතු පුරවැසියන් බවට කුඩා වියේ සිටම හුරු කරවීම වර්තමානයේ අපගේ යුතුකමක් වී ඇත. එබැවින් මෙම යුගයේ අවශ්‍යතාව හඳුනාගත් ජාතික විද්‍යා පදනම පරිසර හිතකාමී මතු පරපුරක් බිහිකිරීම උදෙසා පළමු ශ්‍රේණියේ සිට පස්වන ශ්‍රේණිය දක්වා දරුවන් හට මෙම "ළමා පරිසරවේදියා" වැඩසටහන හදුන්වාදීමට බලාපොරොතු වේ. තවද නිවසේ රැඳී සිටින මෙම කාලය වඩාත් ඵලදායීව ගතකිරීමටද මෙම වැඩසටහන් උපකාරී වේ යැයි අපගේ බලාපොරොත්තුවයි. රජය මගින් පිළිගත් රාජ්‍ය/පෞද්ගලික පාසල් වල දරුවන් හට මෙම වැඩසටහනට සහභාගි වීමට අවස්ථාව ඇත. මේ සඳහා ඔබේ දරුවා යොමුකල හැක්කේ කෙසේදැයි පහත උපදෙස් මාලාව පරිශීලනයෙන් දැනුවත් වෙන්න.



## සොබාදහම ගවේෂණය කිරීමට දෙමාපියන්ට හෝ ගුරුවරුන්ට, දරුවන්ට මඟ පෙන්වාදිය හැක්කේ කෙසේද?

ඔබ වාසය කරන නිවසේ ගෙවත්තේ සහ අවට ඇති පරිසර පද්ධතියක් ඔබගේ ආරක්ෂාව මධ්‍යයේ දරුවාට නිදහසේ ගවේෂණය කරන්න ඉඩ ලබා දෙන්න. ඔබට දරුවා එවැනි අධ්‍යනයක් සඳහා යොමු කළ හැකි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

- අවට පරිසරයේ ඇති ඖෂධීය ශාකයක් දරුවාට තෝරා ගැනීමට ඉඩ දෙන්න. ඉන්පසු එය වැඩෙන පරිසරය, එහි ස්වභාවය, එය පඳුරක් ද, වැලක්ද යන්න, මල්, ගෙඩි හට ගන්නා ආකාරය ආදිය වාර්තා කිරීමට ඉඩ සලස්වන්න. එහි ඖෂධීය වටිනාකම, ආහාරයක් ලෙස යෝදා ගත හැකිද යන්න පිළිබඳ තොරතුරු සොයන්න යොමු කරන්න. කුඩා පැළෑටියක් නම් පැළෑටියමද, නැතහොත් ශාක කොටසද වියලා අලවන්න ඉඩ දෙන්න. එය පිළිබද වැඩිදුර තොරතුරු පොත් පත් මගින්, වැඩිහිටියෙකුගෙන් හෝ අන්තර්ජාලයේ විශ්වාසදායක වෙබ් අඩවි ආශ්‍රිතව තොරතුරු ලබා ගැනීමට උපකාර කරන්න.

- දරුවන්ට තම ගෙවත්තට පැමිණෙන කුරුල්ලන් නිරීක්ෂණය කළ හැක. එක් විශේෂයක් තෝරාගෙන ඔවුන්ගේ හැසිරීම, ආහාර සොයාගැනීමේ පුරුදු (උදා: පොළොව මත ඇති ආහාර සොයාගැනීම, දඩයම් කර ආහාර සොයාගැනීම ආදිය), රංචු ගැසීම (රැළක්, යුගලයක් හෝ හුදකලාව ජීවත් වීම) අධ්‍යනය කිරීමට ඉඩ දෙන්න. රූප සටහන් මගින් වාර්තා කිරීමේදී පැස්ටල්, දිය සායම් භාවිත කළ හැක. දවසේ වේලාව සමඟ ඔවුන්ගේ හැසිරීම අධ්‍යනය කර වාර්තා කිරීමට ඉඩ දෙන්න. අවම වශයෙන් සති දෙකක කාලයක් තුළ දිනපතා නිරීක්ෂණ කිරීමට සලස්වන්න.

- දරුවාට ගෙවත්තේ ඇති කෘමීන් (උදා :මකුළුවන්, කුරුමිණියන්, සමනලුන් ආදිය) නිරීක්ෂණය කිරීමට යම් කාලයක් ලබා දෙන්න. එමෙන්ම අත් කාචයක් භාවිතයෙන් සමීපව නිරීක්ෂණය කිරීමට යොමු කරන්න. සතුරන්ගෙන් ආරක්ෂා වීමට ස්වභාවිකව ඔවුන් සකස් වී ඇති ආකාරය (සලබයන්, කෘමීන් පරිසරය සමග ජීවත්වීමට දක්වන අනුවර්තන), වාසස්ථාන සැකසීමට කටයුතු කරන ආකාරය (කුහුඹු ජනපදය කෘමි ජනපදයකට විශිෂ්ට උදාහරණයකි). එක් විශේෂයක් තෝරා ගැනීමට දරුවාට අවස්ථාව ලබා දී නිරීක්ෂණ රූප සටහන් භාවිතයෙන් වාර්තාව සකස් කිරීමට යොමු කරන්න.

- එළවලු බීජ කිහිපයක් රෝපණය කිරීමට දරුවා උනන්දු කරන්න. අස්වැන්න නෙළන තෙක් කාල පරාසය සමඟ වර්ධනය වාර්තා කිරීමට යොමු කරන්න. ගසට පැමිණෙන කෘමි උවදුරු, සමනළයන් ආදියද නිරීක්ෂණය කිරීමට යොමු කරන්න.

- දිවා කාලයේදී, අහසේ වලාකුළුවල ස්වභාවය අධ්‍යනය කිරීමට දරුවා යොමු කරන්න. වර්ෂාවකට පෙර හෝ පසු විවිධ වලාකුළු රටා කාලය සමඟ වෙනස්වීම් නිරීක්ෂණය කර වාර්තා කිරීමට දරුවා යොමු කරන්න. අන්තර්ජාලය හෝ වෙනත් තොරතුරු භාවිතා කර වලාකුළු හැඩ පිළිබඳව දරුවා දැනුවත් කිරීමට කටයුතු කරන්න.



## දරුවා කළ යුත්තේ කුමක්ද?

- X දිනය, වේලාව සමඟ සියලු අධ්‍යනයන් දරුවා විසින්ම සටහන් කළ යුතු අතර විස්තර සටහන්, රූප සටහන් ආධාරයෙන් නිරීක්ෂණ වාර්තා කළ යුතු වේ. ලිවීමට අපහසු දරුවන් චිත්‍ර සටහන් රූප භාවිතයෙන් වාර්තාව ඉදිරිපත් කිරීමට යොමුකරන්න.

- X දරුවාට ඔහුගේ/ඇයගේ නිරීක්ෂණ රූප සටහන් භාවිතා කරමින් ද, වියළන ලද මල්, කොළ ආදිය ඇලවීම ආදියෙන්ද නිර්මාණය කිරීමට ඉඩ දෙන්න.

- X මෙය දරුවෙකු ගේ නිර්මාණයකි. එමනිසා දරුවාට නව්‍යකරණයට, සිතීමට ඉඩ දෙන්න. ඔවුන්ගේ නිර්මාණශීලි හැකියාවන් ඔස්සේ කලාත්මක වාර්ථාවක් සකස් කළ යුත්තේ දරුවා විසින්ම වන අතර ඒ සඳහා ඔවුන් යොමුකිරීමට කටයුතු කරන්න.

- X සඟරා,පොත්පත්, අන්තර්ජාලය ආදී ප්‍රභවයන් ඔස්සේ ලබාගත් පින්තූර අවසන් වාර්තාව සකස් කිරීමට භාවිත නොකරන්න.

- X අත්‍යවශ්‍ය තැන් වලදී පමණක් ඡායාරූප භාවිතා කරන්න. දරුවාගේ නිර්මාණශීලීත්වයට මුල්තැන දෙන්න.

## තරග නිර්ණායක

1. අවුරුදු 06-10 (1-5 ශ්‍රේණිවල අධ්‍යාපනය ලබන දරුවන්)

2. දරුවාව මේ සදහා යොමුකිරීම සහ ඔහුට/ඇයට මගපෙන්වීම දෙමාපියන්, වැඩිහිටියකු හෝ පාසල් ගුරුවරයෙකු විසින් සිදුකල හැක.

3. අවසන් වාර්තාව සකස් කිරීමේදී A4 කඩදාසියක එක් පැත්තක් පමණක් භාවිතා කරන්න.

4. වාර්තාවේ පිටු ගණන 10-20 අතර විය යුතුය.

5. එක් සිසුවෙකුට ලබා දිය හැක්කේ එක් ව්‍යාපෘතියක් පමණි.

6. අවසන් වාර්තාවට හොඳ නිමාවක් ලබා දීම සඳහා සුදුසු පිටු සැකසුම් හා ඇමුණුම් ක්‍රමවේදයක් භාවිතා කල හැක.

7. වාර්තාව සැකසීම සදහා ජාතික විද්‍යා පදනම විසින් ලබා දී ඇති ආකෘතිය දරුවාගේ නිර්මාණශීලීභාවයට හානි නොවන ලෙස යොදාගැනීම සිදුකරන්න.

8. ව්‍යාපෘතිය ශිෂ්‍යයාගේම ක්‍රියාකාරකමක් විය යුතු අතර වැඩිහිටියන්ගේ අනවශ්‍ය බලපෑම සහ දායකත්වය අනාවරණය වුවහොත් අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට ජාතික විද්‍යා පදනමට පූර්ණ බලය ඇත.

9. සියළුම ව්‍යාපෘති දරුවන්ගේ ක්‍රියාකාරකම් ලෙස දෙමාපියන්ගේ සහතිකය සමඟ ඉදිරිපත් කළ යුතු අතර පාසල විවෘත කිරීමෙන් පසු පන්තිභාර ගුරුවරයාගේ සහතිකය පාසල් විදුහල්පති විසින් සනාථ කර ජාතික විද්‍යා පදනමෙහි ඉල්ලීම පරිදි ඉදිරිපත් කළ යුතුය.

10. අයදුම්පත : මෙම තරගයට සහභාගීවීමට උනන්දුවක් දක්වන දරුවන්ගේ අයදුම්පත් 2020 අගෝස්තු 15 වන දින හෝ ඊට පෙර **“Kid Naturalist 2020”** ලෙස දක්වා 0713216023 අංකයට **WatsApp** කරන්න. නැතහොත් **maduka@nsf.gov.lk** යන විද්‍යුත් ලිපිනයට ලැබීමට සලස්වන්න.

11. වාර්තාව : දරුවා විසින් සකස් කරන ලද වාර්තාව 2020 සැප්තැම්බර් 18 වන දින හෝ ඊට පෙර **“Kid Naturalist 2020”** ලෙස දක්වා **maduka@nsf.gov.lk / abhimani@nsf.gov.lk** යන විද්‍යුත් ලිපිනයන්ට ලැබීමට සලස්වන්න. තොරතුරු පත්‍රිකාව වාර්තාව සමග ලැබීමට සැලැස්වීම අනිවාර්ය වේ.

12. විනිශ්චය මණ්ඩලයේ තීරණය තරඟයේ අවසාන තීරණය වන අතර ජයග්‍රාහකයින් ප්‍රකාශයට පත් කිරීමෙන් පසු කිසිදු අභියාචනයක් සැලකිල්ලට නොගැනේ.

13. රටේ පවත්නා සෞඛ්‍ය හා ආරක්ෂක තත්ත්වය සැලකිල්ලට ගනිමින් ජාතික විද්‍යා පදනම විසින් සංවිධානය කරනු ලබන ජාතික සම්මාන උළෙලකදී ජයග්‍රාහකයින්ට ත්‍යාග පිරිනැමීම සිදුකරනු ලැබේ.



NATIONAL SCIENCE FOUNDATION

වැඩි විස්තර සඳහා :

www.nsf.gov.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

මධුකා සේනාරත්න
(දුරකථන: 0112696771 Ext 183)

අභිමානී රණතුංග
(දුරකථන: 0112696771 Ext 184)

ආචාර්ය පී.ආර්.එම්.පී. දිල්රුක්ෂි රණතුංග,
අංශ ප්‍රධානී, විද්‍යාව ප්‍රචලිත කිරීමේ අංශය,
ජාතික විද්‍යා පදනම, 47/5,
මේට්ලන්ඩ් පෙදෙස, කොළඹ 07.
දුරකථන: 011-2209509; 2696771 දිගුව 180
විද්‍යුත් තැපෑල: dilrukshi@nsf.gov.lk